**ශීර්ෂය 333 - කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 333 - කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 අප්‍රේල් 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 තා පිළිබඳ වාර්තාවවෙනත් නෛතික අවශා

කාශ කාරව පහත සඳහන් කරුණු මා ප්‍රවගන්තිය ප්‍ර (ඈ) (1)6 දරන ජාතික විගණන පනතේ 19 අංක 2018 .කරමි

(අ) මූලා‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූලා‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූලා‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයයන් 04ක මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා එකතුව රු.1,739,000 ක් එනම් මූලික ඇස්තමේන්තුවෙන් සියයට 35 සිට සියයට 455 ක් දක්වා පරාසයකින් මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම් මඟින් ප්‍රතිපාදන වැඩිකරගෙන තිබුණි. | ඉන්ධන මිල ඉතා අධික ලෙස ඉහළ යාම, නඩත්තු කටයුතු සඳහා මිල ගණන් අධික ලෙස ඉහළ යාම හා අපේක්ෂා නොකළ වියදම් දැරීමට සිදුවීම නිසා අමතර ප්‍රතිපාදන සලසා ගන්නා ලදී. | මු. රෙ. 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු සැකසීමේදී හැකිතාක් නිවැරදිව හා තාත්ත්විකව පිළියෙල කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ සියලු වත්කම් මධ්‍යගතව ලේඛනගත කිරීම තුළින් රජයේ වත්කම් කළමනාකරණය, වත්කම් පිළිබඳ පිරිවැය කළමනාකරණය හා අධීක්ෂණය කිරීම අරමුණු කොටගෙන 2017 වර්ෂයේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අයවැය යෝජනාවක් අනුව | 2017 මාර්තු 07 සිට 2022 දෙසැම්බර් 31 කාලය තුල වසර දෙකක පමණ කාලයක් COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් සියළුම රාජ්‍ය ආයතනවල කාර්යයන් පූර්ණ මට්ටමින් සිදු | කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය පිහිටුවීමේ අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය පිහිටුවා තිබුණි. ඉඩම්, ගොඩනැගිලි, මෝටර් රථ, නැව්, ගුවන් යානා, යන්ත්‍රෝපකරණ ආදිය ද ඇතුළත් දේශීයව හා විදේශීයව රජය සතු සියලු වත්කම් මධ්‍යගතව ලේඛනගත කිරීම කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය ඉටු කළ යුතු ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේවුවද, කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය පිහිටුවා 2022 දෙසැම්බර් 31 දින වන විට වසර 05 ක් ඉක්මගොස් තිබුණ ද, ඉහත දක්වන ලද සියලු වත්කම් ඇතුළත් කොට මධ්‍යගතව ලේඛනගත කිරීමක් සිදු කිරීමට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට නොහැකි වී තිබුණි. | කිරීමට නොහැකි තත්ත්වයක් පැවතුණි. වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 01/2017 මඟින් ඉදිරිපත් කරන ලෙස දන්වන ලද තොරතුරු ඉදිරිපත් කිරීමට කිසිදු රාජ්‍ය ආයතනයක් අවශ්‍ය සහයෝගය ලබා නොදුන් අතර, මෝටර් වාහන, ගොඩනැගිලි හා ඉඩම් පිළිබඳ දත්ත පද්ධතිය සකස් කිරීමට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට දැඩි ප්‍රයත්නයක් දැරීමට සිදු වූ අතර එම වත්කම් පිළිබඳ තොරතුරු ඔබ වෙත ලබා දී ඇත.<br><br>ඊට අමතරව දත්ත පද්ධතිය සකස් කිරීම සම්බන්ධයෙන්, මෝටර් වාහන දත්ත පද්ධතිය 2017 වර්ෂයේ සකස් කර 2019 හා 2021 වර්ෂවල යාවත්කාලීන කර ඇත. | |

### 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී විධිමත් පවරා ගැනීමකින් තොරව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සතු වාහන 03 ක් කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා භාවිතයට ගෙන තිබුණි. | කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ ප්‍රවාහන අවශ්‍යතාවය කළමනාකරණය කර ගැනීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වාහන තාවකාලිකව භාවිතා කරන ලදී. | විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ පුරප්පාඩු 09 ක් පැවති අතර, එම පුරප්පාඩු අතරින් 05 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු විය. | කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සේවා අවශ්‍යතාවය අනුව තනතුරු පුරප්පාඩු පිරවිය යුතු වේ. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |